| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.22 පැය 1700 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1874/2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**හෙට දින සිට මගී ප්‍රවාහන බස් රථ ඇතුළු අනෙකුත් වාහන පරීක්ෂා කිරීමේ දීපව්‍යාප්ත රථවාහන මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීම - පොලිස් මූලස්ථානය.**

පසුගිය දිනවල මගී ප්‍රවාහන බස් රථ ඇතුළු අනෙකුත් වාහනවලින් සිදු වූ රිය අනතුරු සැලකිල්ලට ගනිමින් දිගින් දිගටම එවැනි අනතුරු සිදුවීම අවම කර ගැනීම සඳහා වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් අනුව 2024.12.23 වන දින සිට උත්සව සමය අවසන් වන තුරු දිවයින පුරා දීපව්‍යාප්ත රථවාහන මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

මෙහිදී ප්‍රධාන වශයෙන් පොදු මගී ප්‍රවාහන බස් රථ පරීක්ෂා කිරීම සිදු කෙරෙන අතර, එම බස් රථවල රියදුරන්, මත්පැන් පානය කර හෝ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතා කර රිය ධාවනය සිදු කරන්නේද යන්න විශේෂයෙන් සොයා බැලීම මෙන්ම බස් රථ අපරීක්ෂාකාරි හා අන්තරාදායක ලෙස ධාවනය, අධික වේගයෙන් රිය ධාවනය, මාර්ග නීති උල්ලංඝනය කරමින් ධාවනය, ධාවනයට නුසුදුසු තත්වයේ ටයර් හෝ වෙනත් දෝෂ සහිතව ධාවනය කිරීම සම්බන්ධයෙන් ද පරීක්ෂා කර බලා එම රියදුරන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. එමෙන්ම මීට සමගාමීව අනෙකුත් රථවාහන සම්බන්ධයෙන් ද පරීක්ෂා කිරීම් සිදු කෙරෙන අතර ඒ සඳහා දිවයින පුරා පැය 24 ම ආවරණය වන පරිදි රථවාහන නිලධාරින් රාජකාරි යොදවනු ලැබේ.

වැඩ බලන පොලිස්පතිතුමාගේ නියමයෙන් ක්‍රියාත්මක කෙරෙන මෙම විශේෂ මෙහෙයුමේ ප්‍රධාන අරමුණ වනුයේ උත්සව සමයේ මහජනතාව විවිධ අවශ්‍යතාවයන් සඳහා වැඩි වශයෙන් පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරීම සහ පුද්ගලික රථවාහන මඟින් මාර්ග වල ගමන් කිරීමත් සමඟ එම රියදුරන්ට, මඟීන්ට හා පදිකයින්ට සිදු විය හැකි අනතුරු හැකිතාක් අවම කර ගැනීම වේ.

මෙම විශේෂ මෙහෙයුම ක්‍රියාත්මක වන කාලසීමාව තුල අපරීක්ෂාකාරී හා නොසැලකිලිමත් ලෙස හෝ මාර්ග නීති උල්ලංඝනය කරමින් ධාවනයේ යෙදෙන බස් රථ ඇතුළු රථ වාහන සම්බන්ධයෙන් 119 හා 1997 යන කෙටි දුරකථන අංකවලට තොරතුරු ලබා දීමට මහජනතාවට හැකි වන අතර මෙම අංක වලට අමතරව අදාල ප්‍රදේශය අයත් පොලිස් කොට්ඨාසයේ කොට්ඨාස භාර නිලධාරියාගේ ජංගම දුරකථන අංකය වෙත හෝ පහත සඳහන් අනෙකුත් රථවාහන කොට්ඨාස භාර නිලධාරින්ගේ ජංගම දුරකථන අංක වෙත ද තොරතුරු ලබා දීමට හැකියාව පවතී. එමෙන්ම මාර්ග නීති රීති උල්ලංඝන කිරීම් හෝ අනෙකුත් වැරදි සම්බන්ධයෙන් වීඩියෝ පට ඇත්නම් එම වීඩියෝ පට ද වට්ස්ඇප් මඟින් එම දුරකථන අංක වෙත යොමු කිරීමට ද හැකියාව පවතින අතර එම තොරතුරු අනුව ද අදාල නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

අදාල කොට්ඨාස භාර නිලධාරින්ගේ ජංගම දුරකතන අංක පහත පරිදි වේ.

| කොට්ඨාසය | දුරකථන අංක |
|---|---|
| මාතර | 071-8591433 |
| ගාල්ල | 071-8591452 |
| ඇල්පිටිය | 071-8591472 |
| තංගල්ල | 071-8591488 |
| පුත්තලම | 071-8591289 |
| හලාවත | 071-8591304 |
| කුලියාපිටිය | 071-8591260 |
| නිකවැරටිය | 071-8591274 |
| කුරුණෑගල | 071-8591244 |
| මහනුවර | 071-8591042 |
| තෙල්දෙණිය | 071-8592274 |
| මාතලේ | 071-8591079 |
| ගම්පොල | 071-8591070 |
| නුවරඑළිය | 071-8591094 |
| හැටන් | 071-8591114 |
| රත්නපුර | 071-8591382 |
| කෑගල්ල | 071-8591410 |
| සීතාවකපුර | 071-8591423 |
| ඇඹිලිපිටිය | 071-8591392 |
| කන්තලේ | 071-8591187 |
| අම්පාර | 071-8591145 |
| මඩකලපුව | 071-8591127 |
| ත්‍රිකුණාමලය | 071-8591170 |
| කන්කසන්තුරය | 071-8591315 |
| යාපනය | 071-8591327 |
| වව්නියාව | 071-8591340 |
| මන්නාරම | 071-8591363 |
| කිලිනොච්චිය | 071-8591347 |
| මුලතිව් | 071-8591374 |
| මොණරාගල | 071-8591533 |
| බණ්ඩාරවෙල | 071-8591520 |
| බදුල්ල | 071-8591508 |
| කැබිතිගොල්ලෑව | 071-8592902 |
| පොලොන්නරුව | 071-8591230 |
| අනුරාධපුර | 071-8591200 |
| කළුතර | 071-8591688 |
| පානදුර | 071-8591674 |
| කැලණිය | 071-8591589 |

අධ්‍යක්ෂ කොළඹ නාගරික රථවාහන කොට්ඨාසය - 071 8591741
අධ්‍යක්ෂ රථවාහන මූලස්ථානය - 071 8591967
අධ්‍යක්ෂ බස්නාහිර පළාත උතුර රථවාහන කොට්ඨාසය - 071 8592857
අධ්‍යක්ෂ බස්නාහිර පළාත දකුණ රථවාහන කොට්ඨාසය - 071 8592278

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**